# ක්වාසි විනිසුරුවරුන් පත් කිරීම - 2023

## අධිකරණ සේවා කොමිෂන් සභාව

මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල 'ක්වාසි' තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1. බේරුවල | 2. බෝරා ප්‍රජාව | 3. කොළඹ උතුර | 4. කොළඹ දකුණ |
| 5. හැටන් | 6. හොරණ | 7. මාතර | 8. පානදුර |
| 9. වවුනියා | 10. යාපනය | | |

**මූලික සුදුසුකම් :**

අයදුම්කරු,

- වයස අවුරුදු 40ට වැඩි විවාහක මුස්ලිම් පුරුෂයෙකු විය යුතුය
- පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු හෝ
- මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ
- අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ
- නීතිඥවරයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ
- රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරියෙකු විය යුතුය.

දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකු හට මේ සඳහා අයදුම් කළ නොහැක.

**අනෙකුත් සුදුසුකම් :**

- අයදුම්කරු ඉස්ලාම් ආගම පිළිපදින්නාවූ මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත හා ඉස්ලාම් නීතිය පිළිබඳ විශේෂිතවූ මනා දැනුමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති පුද්ගලයෙකු විය යුතුය.
- තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.
- ක්වාසිවරයෙකු තමා පත් කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචි වී සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

**ගෙවීම් :**

- ක්වාසිවරයා හට මසකට රුපියල් 7,500/= ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා උපරිම රුපියල් 6,250/= ක් ඇතුළුව මසකට 13,750/- ක ගෙවීමක් කරනු ලැබේ.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය :**

2023 අප්‍රේල් මස 24 වන දින

**අයදුම් කිරීමට අදාළ විස්තර හා වෙනත් තොරතුරු :**

2023.03.31 දිනැති ගැසට් නිවේදනය බලන්න.

ගැසට් පත්‍රයෙහි පළකර ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,**
**ක්වාසි අංශය,**
**අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,**
**තැ.පෙ. 573, කොළඹ 12.**

**0112433119 / 0112451159**